3 වන පිටෙන්

වන විට ජනාධිපතිවරයා දූෂණයට එරෙහිව දැවැන්ත හඬක් නගමින් තිබේ. එහෙත්, දූෂණයට එරෙහිව ආයතන ශක්තිමත් කිරීමකින් තොරව පෞද්ගලිකව කෑගැසීමෙන් කිසිවක් සිදු වන්නේ නැත. පසුගිය වසර තුන තුළ ද මේ රටේ බරපතල දූෂණ සිදු වූ අතර ආණ්ඩුවේත්, රජයේත් ඉහළ සිට පහළ දක්වා පිරිස් එයට සම්බන්ධ වූ හ. ඔවුන් පිළිබඳ විමර්ශන සිදු වන්නේ හා අඩු තරමේ නම් කර ලජ්ජාවට පත් කිරීම හෝ සිදු වන්නේ රටෙහි ආයතන පසුගිය සමයේ යම් තරමකට ස්වාධීන හා ශක්තිමත් වූ නිසා ය. නීතිය ක්‍රියාත්මක වීම පමා වන්නේ ආයතනවල ශක්තියේ ගැටලුව නිසා ය.

> **මෙම සුළු පක්ෂ නියෝජනයෙහි වැදගත්කම ඇත්තේ විශේෂයෙන් ම දූෂණය වළක්වා ගැනීමෙහි ලා ය. එහෙත්, පළාත් පාලනයේ සිට ම දේශපාලනය සම්බන්ධයෙන් සක්‍රිය පුරවැසි සහභාගිත්වයක් නො තිබුණහොත් මේ කිසිවකින් තත්වය වෙනස් කරන්නට බැරි වනු ඇත.**



දූෂණයෙන් තොර පිරිස් පත් කිරීමෙන් දේශපාලනය පිරිසිදු කළ හැකි යයි ඇතැමෙක් විශ්වාස කරති. එහෙත්, සමාජය තුළ අපට හමු වන්නේ දූෂණයෙහි කෙළ පැමිණි පිරිස් හා දූෂණයට අවස්ථා නො ලද පිරිස් පමණකැයි සිතන්නට ඕනෑ තරම් සාක්ෂි අපට තිබේ. ඕනෑම පිරිසිදු ආධුනික දේශපාලකයකු පවා දූෂ්‍ය කිරීමට තරම් බලවත් රාජ්‍ය ව්‍යූහයක් ලංකාවේ තිබේ. එයට මහජනතාවත් සම්බන්ධ ය. එහෙයින් සමාජ වෙනස්කම් සිදු කිරීම ලෙහෙසි නැත.

දේශපාලනයේ කාන්තා නියෝජනය ඉහළ නැංවීම අත්‍යවශ්‍ය දෙයකි. එයින් කාන්තාවන්ගේ වත්මන් තත්වය සාකච්ඡාවට ගත හැකි ය. 2015 වසරේ නිල ශ්‍රම බලකා දත්ත අනුව, ලංකාවේ වැඩ කළ හැකි වියේ කාන්තාවන්ගෙන් ශ්‍රම බලකායේ ඉන්නේ 36%කට අඩු පිරිසකි. කාන්තාවන්ගෙන් 1%ක්වත් ව්‍යවසායකයන් වන්නේ නැත. දේශපාලනයේ කාන්තා නියෝජනයේ ඉහළ යාම සමග මෙම තත්වයන් වෙනස් වන්නේ නම්, එය කාන්තා නියෝජනය ඉහළ නැංවීම වෙනුවෙන් මහජනයා දරන වියදමට සාධාරණයකි.

පළාත් පාලන සභික සංඛ්‍යාව විශාල වශයෙන් ඉහළ යන්නට හේතු වූ තවත් කරුණක් වන්නේ සුළු පක්ෂ නියෝජනය වෙනුවෙන් සමානුපාතික ලැයිස්තුවකට ඉඩ ලබා දීමයි. මෙම සුළු පක්ෂ නියෝජනයෙහි වැදගත්කම ඇත්තේ විශේෂයෙන් ම දූෂණය වළක්වා ගැනීමෙහි ලා ය. එහෙත්, පළාත් පාලනයේ සිට ම දේශපාලනය සම්බන්ධයෙන් සක්‍රිය පුරවැසි සහභාගිත්වයක් නො තිබුණහොත් මේ කිසිවකින් තත්වයන් වෙනස් කරන්නට බැරි වනු ඇත.

පළාත් පාලන සභිකයන්ට ප්‍රාදේශීය සංවර්ධනය සඳහා සෘජුව ම ප්‍රතිපාදන ලබා දීමේ ක්‍රමවේදයක් ද ලංකාවේ තිබේ. භූගෝලීය පදනමින් කොට්ඨාස සඳහා පත් වන 60%ක් වන සභිකයන්ට හා සමානුපාතික නියෝජනය අනුව ලැයිස්තුවෙන් පත් වන සභිකයන්ට ප්‍රතිපාදන බෙදා දෙන්නේ කෙසේ ද, එසේ බෙදා දෙන ප්‍රතිපාදන භාවිතා වනු ඇත්තේ කුමන ආකාරයෙන් ද වැනි ගැටලු රැසක් විසඳා ගත යුතුව තිබේ. මේ මහජන මුදල් ය.

අවසානයේදී පළාත් පාලනය නිසා තවත් වටයකින් රජය ප්‍රසාරණය වී තිබේ. දැනටත් පැසවූ හොරි ගෙඩියක් වැනි වන රජයට මේ ඉදිමීම දරා ගන්නට පුළුවන් ද? එය පුපුරා ගියහොත් රටට හා ජනතාවට සිදු වනු ඇත්තේ කුමක් ද? මේ සියල්ලට ම විසඳුම් තිබෙන්නේ දේශපාලන නායකත්වය අතේ ය. දේශපාලන නායකත්වය ඒවා ක්‍රියාත්මක කරනු ඇත්තේ පුරවැසියන් නිසි පරිදි මැදිහත් වන්නේ නම් පමණි. සුබවාදීව බැලූවොත්, ගමේ ආණ්ඩුවෙන් ගමේ සංවර්ධනය සිදු කර ගන්නට පුළුවන. එහෙත්, ඒ සඳහා ගමේ ආණ්ඩුවේ සවිබල නැංවිය යුතු ය. එහි ධාරිතාවන් පුළුල් කළ යුතු ය.

**TO LET**

**MOUNT WAVERLEY**
GRANNY FLAT,

Standalone one BR unit with amenities and parking.
Separate entrance and service connections.
Suits a couple. $230 p/w,

**Text: 0423304673**

## සන්නස Cartoon by PK




